## ‘කන්තෝරුව කන්තෝරුව මම වැඩකරන’



# බයිලාවෙන් රට නැළ වූ ඇන්ටන් ජෝන්ස්

ඔහු

කොළඹ අලුත්කඩේ විසූ සුළු ව්‍යාපාරික පර්සි ජෝන්ස් සහ ජේන් ජෝන්ස් යුවළගේ පුතෙකුව ඇන්ටන් ජෝන්ස් 1937 ජුනි 03 දින මෙලොව එළිය දුටුවේය. අලුත්කඩේ ශාන්ත සෙබස්තියන් ඉංග්‍රීසි මිශ්‍ර පාසලෙන් අපොස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ ඇන්ටන් පාසල් අධ්‍යාපනයට සමුදී හාහාපුරා කියා බැඳුනේ නීතිඥ ආයතනයක රැකියාවකටය. කෙටි කලකින් එම රැකියාවට සමුදී ලංකා බැංකුවේ ලඝු ලේඛක රැකියාවක් ලබාගත්තේය. 1960 වසරේදී විවාහ දිවියට පිවිසි ඇන-ටන් එතෙක් දෙමාපියන් සමග විසූ අලුත්කඩේ කුලී නිවෙසින් සමුගෙන දෙහිවල කවුඩානේ තමන්ගේම නිවහනක පදිංචියට ගියේය.

පාසල් අවදියේ සිට දේශීය බයිලා ගායනයේ පුරෝගාමියා මෙන්ම එවක ප්‍රමුඛයාද වූ වොලී බැස්ටියන්ගේ සංගීත කණ්ඩායමට එක්ව සමූහ ගායනයේ යෙදුනු ඇන්ටන් පසු කාලයේ ශ්‍රී ලාංකේය වේග රිද්ම ගී ක්ෂේත්‍රයේ ස්වකීය අනන්‍යතාව සනිටුහන් කළේ අනුවේදනීය සත්‍ය සිදුවීම් අළලා ලියැවුන ගී ගායනා කරන්නෙකු විලසිනි. හෙතෙම ප්‍රථම වතාවට ගුවන් විදුලි සංස්ථාවේ වේග රිද්ම ගී වැඩසටහනක් ඉදිරිපත් කරමින් ගායන ලෝකයට පිවිසියේ 1958 වසරේදීය. එහි සාර්ථකත්වය හේතුවෙන් එවක දිවයිනේ ප්‍රමුඛ කැසට් නිෂ්පාදන ආයතන දෙකක් ඔහුගේ ගී ඇතුළත් කැසට්පට නිෂ්පාදනය කිරීමට ඉදිරිපත්වූ අතර එම කැසට් පටවල ඇතුළත් වූ ගී රසිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය වන්නට ගතවූයේ කෙටි කාලයකි. ඒ ජනප්‍රියත්වය පසුපස වූයේ ඇන-ටන්ගේ හඬ පෞර්ෂයේත් බයිලා ගායනයේදී යෙදෙන සික්ස් එයිට් රිද්මයේත් සුසංයෝගයයි. පසුව ඇන්ටන් ජෝන්ස් වේග රිද්ම ගී ලොවේ ඉදිරියෙන්ම කියැවෙන නමක් බවටත් ප්‍රසංග වේදිකාවේ නිතොර දිදුලන තරුවක් බවටත් පත්විය. ශ්‍රී ලංකා කලා ක්ෂේත්‍රය උදෙසා ඉටුකරන ලද විශිෂ්ට සේ-වයට උපහාර වශයෙන් 2006 මැයි 22 දින රජය ඔහුට කලා භූෂණ සම්මානය ප්‍රදානය තරනු ලැබුවේය.

දෙහිවල කවුඩානේ පිහිටි සිය නිවෙසේදී ඉකුත්දා මා ඔහු අභිමුඛ වන විට ඇන්ටන් සිටියේ අසනීප තත්ත්වයෙනි. කැසට් කවරයේ හෝ ප්‍රසංග වේදිකාවේ හෝ රූපවාහිනී තිරයේ අප දුටු පුරුදු ප්‍රතාපවත් රූපකාය ඔහුගෙන් බැහැර ගොස් තිබුණි. සිව්දරු පියෙකුව දරු-වන්ගේ දරුවන්ද දුටු ලංකා බැංකු සේවයෙන්ද විශ්‍රාම ලැබ දිවියේ සැඳෑ සමය ගතකරමින් සිටි ඔහුට ගායන දිවියෙන්ද දුරස්වන්නට සිදුවී තිබුණේ හදිසියේ ඇතිවූ අසනීප තත්ත්වය හේතුවෙනි. අතීතයේ බොහෝ සිදුවීම් පවා ඔහුගේ මතකයෙන් මකා දමන්නට හදිසි තත්ත්වය හේතුවී තිබුණි. වියපත් වූ දරුවන් මහ ගෙදරින් වෙන්ව ගොසිනි. එහෙත් සහෘද කතාබහක් වෙනුවෙන් ඔහුගේ හඬ පෞර්ෂය තවදුරටත් ඔහු හා නො-වෙනස්ව රැඳී තිබිණි.

**ජීවිතයේ සැඳෑ සක්මනේ යෙදී ඉන්න අතරේ ඔබ හදිසි අනතුරකට මුහුණ දුන් බව පහුගිය දවසක අපිට දැනගන්න ලැබුණා. මොකද වුණේ ? දැන් කො-හොමද ? කියන තැනින් අපි කතාබහ පටන්ගත්තොත් ?**

දැන් මාස කීපයක් වෙනවා අසනීප වෙලා. මට ස්ට්‍රෝක් එකක් ආවනේ. එදා මම බයික් එකේ ගමනක් යද්දී එක සැරේම සිහිය නැතිවෙලා වගේ ඇදගෙන වැටුණා. පස්සේ කට්ටිය එකතුවෙලා මාව ඉස්පිරිතාලෙට ගෙනියලා තිබුණා. සිහිය ආවට

*<u>කන්දේ හැපුන මහ වනන්තරේ</u>*
*<u>ඩීසී අට අහස් යන්තරේ</u>*

පස්සේ මට දැනුනා වම් අතයි කකුලයි පණ නෑ කියලා. තවම බෙහෙත් කරනවා. ඒත් ඒ අතයි කකුලයි වැඩකරන්නේ නෑ. ඒ නිසා දැන් ඇදේම තමයි දවස ගෙවෙන්නේ.

**මේ තත්ත්වය ඔබගේ කලා ජීවිතයට මොනවගේද බලපාල තියෙන්නේ ?**

කතා කරන්න අපහසුවක් නැති නිසා සින්දු කියන්නත් අපහසුවක් නෑ. ඒත් හිටගෙන ඉන්න බැරි කමයි ඇවිදින්න බැරිකමයි නිසා සංගීත ප්‍රසංගවලට යන්න විදිහක් නෑ. මේ අත්වාරුව තිය තිය තමයි ඇවිදින්-න්. ඒත් තව කෙනෙක් උදව්වට ඉන්න ඕනේ. තනියම යන්න එන්න අමාරුයි. හැබැයි ඉඳගෙන සින්දු කියන්න පුළුවන්. ඔය එක එක රූපවාහිනී නාලිකාවලින් නම් කතාකරනවා ඒ අයගේ ප්‍රසාංගික වැඩසටහන්වලට සහභාගිවෙන්න කියලා. හැබැයි නොමිලේ. ශතයක්වත් ගෙවන්නේ නෑ. රූපවාහිනී සංස්ථාව විතරයි ඒවගේ වැඩසටහන්වලට සහභාගි වෙනවට ගෙවන්නේ. මේ තියන අමාරුත් එක්ක අතෙන් වියදම් කරගෙන ඕවට සහභාගිවෙන්න බැරි නිසා මම කතාකලාට යන්නේ නෑ.

**මෑත කාලයේ ඔබගේ ගායනා අහන්න ලැබුණෙත් බොහොම අඩුවෙන්. අසනීප වෙන්න කලින් ඉඳලම කලා ජීවිතයෙන් යම් ආකාරයකට දුරස් වෙලාද හිටියේ ?**

නෑ. සංගීත ප්‍රසංගවලට ගියා. කැසට් පටි කළා. අන්තිම කැසට් එක 2008 සන් ෆ්ලවර්ස් එක්ක කළේ. මගේ පැරණි ගී එකතු කරලා නොනවතින ගී කියලා. මම කොහොමත් ක්ෂේත්‍රයට ආව කාලේ ඉඳලම සැරෙන් සැරේ කැසට් කළා. මේ වෙනකොට කැසට් 35 ක් කරලා තියනවා. සී.ඩී. දෙකක් කරලා තියනවා. ප්‍රසංගවලට සහභාගිවෙන එකත් දිගටම කරගෙන ආවා.

සංවාදය සහ සේයා රූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

ලෝකයේ රටවල් හුගකට මම ප්‍රසංගවලට ගිහින් තියනවා. අසනීප වෙනකන්ම ඒ ගමන මම ආවා.

**ඔබ කොහොමද ගීත ගායනයට යොමුවෙන්නේ ?**

මම පුංචි කාලේ අපි පදිංචිවෙලා හිටියේ අලුත්කඩේ. ඒ කිට්ටුව හිටිය මගේ මාමල දෙන්නෙක් ඒ කාලේ යනවා වොලී බැස්ටියන්ගේ බෑන්ඩ් එකේ මියුසික් කරන්න. මේ දෙන්න යනකොට මාවත් එක්ක යන්න පුරුදුවෙලා හිටියා. මේ කියන්නේ 1952 විතර අතීතේ. මේ ගමන නිසා මට වොලී බැස්ටියන්ගේ බයිලාවල කෝරස් කියන්න අවස්ථාවක් ලැබුණා. මට ගායන හැකියාවක් තියනවා කියන කාරණය මතුවෙන්නේ එතනදි. මෙහෙම කෝරස් කියන අතරේ අවස්ථාවක් ලැබුණාම මම වොලීගේ බයිලත්

*<u>ඔය අතරින් මම හුගක්ම කැමති පුද්ගලයා වුණේ මිල්ටන් මල්ලවාරච්චි. මිනිහ හොඳ ප්‍රතිපත්ති ගරුක කෙනෙක්.</u>*

කියන්න පටන්ගත්තා. එහෙම ඉන්න කොට තමයි මට ගුවන් විදුලි සංස්ථාවේ වේග රිද්ම ගී වැඩස-ටහනක් කරන්න ලැබෙන්නේ. ඒකට මගෙම සින්දු හදන්න සිද්ධ වුණා. ඒ තමයි මගේ මුල්ම ගීත. ‘කන්තෝරුව කන්තෝරුව මම වැඩකරන’ කියන ගීතයත් ඒ මුල්ම ගීවල එකක්. මේ වැඩසටහන අහලා මට ජෙම්ටෝන් එකෙනුයි නිව් සවුන්ඩ් එකෙනුයි කැසට් දෙකක් කරන්න කතාකළා. ‘සල්ලි දීලා ගවුම මැහුවේ ඇඳගෙන යන්න’ කියන ගීතය ඒ කැසට්වල එකක්. මේ කැසට් හුගක් ජනප්‍රිය වුණා. ඊට පස්සේ දිගටම කැසට් කළා. කානිවල්වල සින්දු කියන්න ගියා. ඒ කාලේ සංගීත සංදර්ශණ තිබුණේ නෑනේ. කානිවල් තමයි තිබුණේ.

**ඒ කාලේ අමතක නොවෙන මතකයන් ගැන කතා කළොත් ?**

හුගක් දේවල් අමතකයි. (සුළු වේලාවක් කල්පනාවේ සිට) කානිවල් කාලෙන් පස්සේ ෂෝ පටන්ගත්ත කාලේ විහාර මහ දේවි උද්‍යානයේ තිබුණ ෂෝ වල සින්දු කියන්න ගියා. ටිකට් එකක් රුපියලට තමයි ඒ කාලේ ෂෝ පෙන්නුවේ. පිට පළාත්වල ෂෝවලට සින්දු කියන්න යන ඔක්කොම ඒ කාලේ යන්නේ එකම බස් එකේ. මෙහෙන් හවස්වෙලා යනවා. ෂෝ එක ඉවරවෙලා රෑම ආපහු එනවා. යාපනේ පැත්තේ ෂෝවලට ගියාම ආපහු කොළඹ එනකොට පහුවදා දවල් වෙනවා. එතකොට යුද්ධයක් කියලා දෙයක් තිබුණේ නෑනේ.

**උතුරේ සංගීත සංදර්ශනවලට ගියාම දෙමළ ජනතාවගෙන් ලැබුණ ප්‍රතිචාර මොනවගේද ?**

බොහොම හොඳට අපිට සළකනවා. ඇවිල්ලා කතා කරනවා. සිංහල සින්දුවලට හරි කැමතියි. දෙමළ සින්දු කිව්වොත් අපිට හූ කියනවා. මොකද සිංහල අය දෙමළ කතාකරනකොට වෙන වැරදි ඒ අයට ජෝනවානේ. සිංහල සින්දු තමයි ඉල්ලන්නේ.

**ක්ෂේත්‍රයේ සමකාලිකයෝ කවුද ? මේ වෙනකොට ඒ අය එක්ක මොනවගේ සම්බන්ධයක්ද තියෙන්නේ ?**

සමකාලිකයෝ හුගදෙනෙක් දැන් නෑ. මම එන කාලේ හිටියා එම්.එස්. ප්‍රනාන්දු. ඊළගට මිල්ටන් මල්ලවාරච්චි ජෝතිපාල වික්ටර් මිල්ටන් පෙරේරා ඊට පස්සේ ප්‍රියා සූරියසේන ඔය අය එක්ක තමයි හුගක් වෙලාවට ෂෝවලට යන්නේ. ඔය අතරින් මම හුගක්ම කැමති පුද්ගලයා වුණේ මිල්ටන් මල්ලවාරච්චි. මිනිහ හොඳ ප්‍රතිපත්ති ගරුක කෙනෙක්. ඔය පිරිසෙන් දැන් ඉන්න කීපදෙනා අදටත් හිතවත්. පහුගිය දවසක ප්‍රියා සූරියසේන පවුලේ අයත් එක්ක් ඇවිල්ලා ගියා අසනීප වුණා කියලා ආරංචිවෙලා.



**ඔබ සංගීතය ගැන කිසියම් හැදෑරීමක් කරලා තියනවද?**

නෑ. පුංචි කාලේ ඉඳලම තිබුණ හැකියාව නිසා සින්දු කිව්වා. ඒවා ජනප්‍රිය වුණා. හොඳට සල්ලි හම්බවුණා. ඉතිං සංගීතය ඉගෙන ගන්න කියලා උවමනාවක් ඇතිවුනේත් නෑ. විවේකයක් තිබුනෙත් නෑ. ඒ කාලේ සින්දු කියපු හුගදෙනෙක් සංගීතය ඉගෙනගෙන නෙවෙයිනේ සින්දු කිව්වේ. තමන්ගේ තිබුණ සහජ දක්ෂතාවෙන්. ජෝතිපාලත් සංගීතය ඉගෙනගෙන නෑනේ. හැබැයි දැන්නම් හිතෙනවා එහෙම ඉගෙනගෙන තිබුණානම් තවත් හොඳයි කියලා. වටිනාකම වැඩිවෙනවානේ.